ඌව පළාත් සභාවේ සිංහල මාධ්‍ය පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා රැකියා විරහිත උපාධිධාරීන් හා උසස් ජාතික ගණකාධිකරණ / වාණිජ ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම - 2017

ඌව පළාත් සභාවේ සිංහල මාධ්‍ය පාසල්වල පහත සඳහන් විෂයන්වල පවතින ගුරු පුරප්පාඩු පිරවීම සඳහා රැකියා විරහිත උපාධිධාරීන් හා උසස් ජාතික ගණකාධිකරණ / වාණිජ ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම පිණිස ඌව පළාතේ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2017.02.20 දින වේ.

උපලේඛන අංක 01 - පුරප්පාඩු විෂය ලේඛනය

අ.අ	විෂයය	විෂය කේත අංකය
01-11 වසර දක්වා පුරප්පාඩු විෂයන්		
01.	ප්‍රාථමික	1
02.	සිංහල	2
03.	ව්‍යාපාර හා ගිණුම්කරණය	3
04.	චිත්‍ර	4
05.	නැටුම්	5
06.	සංගීතය (පෙරදිග)	6
07.	නාට්‍ය හා රංග කලාව	7
08.	කෘෂි හා ආහාර තාක්ෂණය	8
09.	ගණිතය	9
10.	භූගෝල විද්‍යාව	10
11	ඉතිහාසය	11
12.	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය	12
අ.පො.ස. (උ/පෙළ) විෂයන්		
1.	රසායන විද්‍යාව	13
2.	භෞතික විද්‍යාව	14
3.	ජීව විද්‍යාව	15
4.	ව්‍යාපාර අධ්‍යයනය	16
5.	ආර්ථික විද්‍යාව	17
6	සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය	18

01. බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :

(අ) අයදුම්කරු / අයදුම්කාරිය පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

(ආ) යහපත් චරිතයකින් හා මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ඇ) 2017.02.20 වන දිනට පූර්වාසන්න වසර 03 ක අඛණ්ඩ ස්ථිර පදිංචියක් ඌව පළාත තුළ තිබිය යුතුය.
(ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරනු ලබන පදිංචිය පිළිබඳ ග්‍රාම සේවා සහතිකයක් මගින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී පදිංචිය සනාථ කළ යුතුය)
ඌව පළාත් සභා සීමාව තුළ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට වසර 03 ක් හෝ ඊට වැඩි ස්ථිර පදිංචියක් ඇති අයකු සමග නීත්‍යානුකූලව විවාහ වී ඌව පළාතේ පදිංචියට පැමිණ අයදුම්පත් කැඳවන අවසාන දිනට ඡන්ද හිමි නාම ලේඛනයෙන් ලියාපදිංචිය සනාථ කරන කෙනෙකුට ද අයදුම් කළ හැක. එවැනි අය ලිඛිත සාක්ෂි මගින් මෙම තත්ත්වය තහවුරු කිරීම අනිවාර්ය වේ.

(ඈ) 2017.02.20 වන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.

සටහන : දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවයේ නියුතු අයට මේ සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ නොහැක.

02. අධ්‍යාපන සුදුසුකම් :

2.1 2.1.1 විෂයයන් 03 කට සම්මාන සාමාර්ථ සහිතව භාෂාව / සාහිත්‍ය හා අංක ගණිතය / ගණිතය විෂයන්ද ඇතුළුව, විෂයන් 06 කින් අ.පො.ස. (සා/පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වීම සමග,

2.1.2 අ.පො.ස. (උ/පෙළ) නව විෂය නිර්දේශය යටතේ සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර අවම වශයෙන් විෂයයන් තුනකින් එකවර සමත් වීම

හෝ

අ.පො.ස. (උ/පෙළ) පැරණි විෂය නිර්දේශය යටතේ විශ්ව විද්‍යාල ප්‍රවේශය සහිතව (අවම වශයෙන් විෂයන් 03 කින්) එකවර සමත් විය යුතුය.

සටහන : විභාග කොමසාරිස් ජනරාල් විසින් දේශීය අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ/පෙළ) විභාග හා සමානව පිළිගනු ලබන විභාග සමතුන්ටද අයදුම් කළ හැක.

2.2 ඉහත 2.1 හි සුදුසුකම් සමග එක් එක් විෂයට අදාලව පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

2.2.1 01-11 වසර විෂයන්ට අදාළ සුදුසුකම් :

අ.අ.	විෂය	අධ්‍යාපන සුදුසුකම්
1.	ප්‍රාථමික	විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයක් මගින් හෝ උපාධි පිරිනැමීමේ ආයතනයක් මගින් පිරිනමනු ලබන සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම.
2.	සිංහල, භූගෝලවිද්‍යාව, ඉතිහාසය	විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි පිරිනැමෙන ආයතනයකින් අයදුම්කරනු ලබන විෂයට අදාලව විශේෂ උපාධියක් ලබා තිබීම.
3.	චිත්‍ර, නැටුම්, සංගීතය (පෙරදිග) සහ නාට්‍ය හා රංග කලාව	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයක් මගින් හෝ උපාධි පිරිනැමීමේ ආයතනයකින් ලබා ගත් ප්‍රාසාංගික කලා / ලලිත කලා හෝ දෘශ්‍ය කලා උපාධියක් **හෝ** අයදුම්කරනු ලබන විෂය ප්‍රධාන විෂයක් ලෙස හදරා උපාධියක් ලබා තිබීම **සහ** අ.පො.ස. (උ/පෙළ) සඳහා අදාළ විෂය හදරා සමත්ව තිබීම. **** සටහන බලන්න**
04.	කෘෂි හා ආහාර තාක්ෂණය	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයක් මගින් හෝ උපාධි පිරිනැමීමේ ආයතනයකින් කෘෂි විද්‍යාවේදී විශේෂ හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.
05.	ගණිතය	විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ උපාධි පිරිනැමීමේ ආයතනයකින් භෞතීය විද්‍යා / ජෛවීය විද්‍යා විශේෂ හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.
06.	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ උපාධි පිරිනැමීමේ ආයතනයකින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය / පරිගණක විද්‍යාව පිළිබඳ විශේෂ හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.
07.	ව්‍යාපාර හා ගිණුම්කරණය	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි පිරිනැමෙන ආයතනයකින් අයදුම්කරනු ලබන විෂයට අදාලව විශේෂ උපාධියක් ලබා තිබීම හෝ උසස් තාක්ෂණ ආයතනයෙන් පිරිනමන සිව් අවුරුදු උසස් ජාතික ගණකාධිකරණ / වාණිජ ඩිප්ලෝමාව ලබා තිබීම.

**** සටහන :** ප්‍රාසාංගික කලා / ලලිත කලා හෝ දෘශ්‍ය කලා විශේෂ උපාධිධාරීන් තරග විභාගයේ එක් එක් විෂයට අදාළ සාධනීය මට්ටම (40%) ලබා ගෙන ඇත්නම් එම අයට ප්‍රමුඛතාවය ලබා දෙන අතර, එම උපාධිධාරීන්ගෙන් පුරප්පාඩු සම්පූර්ණ කිරීමෙන් අනතුරුව තවදුරටත් පුරප්පාඩු ඉතිරිව පවතින්නේ නම් පමණක් තරග විභාගයේ එක් එක් විෂයයට අදාළ සාධනීය මට්ටම (40%) ලබාගෙන ඇති අනෙකුත් උපාධිධාරීන් කුසලතාවයේ අනුපිළිවෙළින් පුරප්පාඩු සම්පූර්ණ වන තෙක් සලකා බලනු ලැබේ.

2.2.2 අ.පො.ස. (උ/පෙළ) විෂයන්ට අදාළ සුදුසුකම් :

අ.අ.	විෂය	අධ්‍යාපන සුදුසුකම්
1.	රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, ආර්ථික විද්‍යාව, සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යනය	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ උපාධි පිරිනැමීමේ ආයතනයකින් අයදුම්කරනු ලබන විෂයට අදාලව විශේෂ හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.
2.	ව්‍යාපාර අධ්‍යනය	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයක් මගින් හෝ උපාධි පිරිනැමීමේ ආයතනයකින් අයදුම්කරනු ලබන විෂයට අදාලව විශේෂ හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයේ සිව් අවුරුදු උසස් ජාතික ගණකාධිකරණ / වාණිජ ඩිප්ලෝමාව ලබා තිබීම.

2.3 එක් එක් විෂයට අදාලව ඉහත 2.1 හා 2.2 හි දක්වා ඇති සුදුසුකම් 2017.02.20 දිනට හෝ ඊට පෙර වලංගු පරිදි සම්පූර්ණ කර තිබිය යුතුය.

03. සේවා කොන්දේසි :

(අ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(ආ) මුලින් පත් කරන පාසලේ වසර 05 ක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතු අතර, කිසිදු හේතුවක් මත ස්ථාන මාරුවීම් හෝ අනුයුක්ත කිරීම් සඳහා කෙරෙන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

(ඇ) වසර 05 ක සේවා කාලයකට පසු ඌව පළාත් ගුරු මාරු ප්‍රතිපත්තිය අනුව සේවා අවශ්‍යතාවය මත ඌව පළාතේ වෙනත් පාසලකට ස්ථාන මාරුවීම් ලබාදීමට ඌව පළාත් සභා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සලකා බලනු ඇත.

(ඈ) රජයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන සංශෝධනවලට ද යටත් වේ.

(ඉ) උපාධිධාරීන් ඌව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 (අ) ශ්‍රේණියටද, ඩිප්ලෝමාධාරීන් ඌව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 (ඇ) ශ්‍රේණියටද බඳවා ගනු ලැබේ.

(ඊ) 2016.02.25 දිනැති රා.ප.ච. අංක 03/2016 හි GE-1-2016 වැටුප් බණ්ඩය යටතේ මාසිකව රු. 27,740/-300X6 - 380X7 - 445X2 - 33,090/- මාසික වැටුප් පරිමාණය අනුව උපාධිධාරීන් 14 වන වැටුප් පියවර වන රු. 32,200/- ක මාසික වැටුප් පියවරෙහිද ඩිප්ලෝමාධාරීන් 7 වන වැටුප් පියවර වන රු. 29,540/- මාසික වැටුප් පියවරෙහිද පිහිටුවනු ලබන අතර, එම චක්‍රලේඛයේ උපලේඛන අංක II අනුව වැටුප් ගෙවනු ලැබේ.

04. බඳවාගැනීමේ ක්‍රමය :

4.1 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.3.2 සහ 7.2.3.4 හි සඳහන් විධිවිධාන අනුව පාසල් පාදක ක්‍රමය අනුව බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

4.2 නියමිත සුදුසුකම් සහිත විධිමත් අයදුම්පත් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු වූ විට තරග විභාගයකින් තොරව ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට සහ ඉගැන්වීමේ හැකියාව මැන බැලීම සඳහා පැවැත්වෙන ප්‍රායෝගික පරීක්ෂණයකට අයදුම්කරුවන් භාජනය කර සුදුස්සන් තෝරා ගැනීමට කටයුතු කරනු ලැබේ.

4.3 නියමිත සුදුසුකම් සහිත අයදුම්පත් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි වුවහොත් ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයෙන් සමත් වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට හා ඉගැන්වීමේ හැකියාව මැන බැලීම සඳහා පැවැත්වෙන ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කර ලිඛිත තරග විභාගයේ හා ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව සුදුස්සන් තෝරා ගැනීමට කටයුතු කරනු ලැබේ.

4.4 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :**
ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් නිවේදනයේ හෝ පුවත්පත් දැන්වීමේ හෝ වෙබ් අඩවියේ දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික හා මානසික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සිදු කෙරේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

4.5 **ප්‍රායෝගික පරීක්ෂණය :**
ගුරු වෘත්තියේදී වැදගත් වන ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අයදුම්කරු සතු කුසලතාවය මැන බැලේ. ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් නිර්ණායක පදනම් කොටගෙන මේ සඳහා ලකුණු ලබාදෙනු ලැබේ.

4.6 එමෙන්ම මෙම ගැසට් නිවේදනයෙන් ආවරණය නොවන යම් කරුණක් වෙතොත් එම අවස්ථා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධානවලට යටත්වනු ඇත.

05. අයදුම් කළ යුතු පිළිවෙළ :

5.1 මෙම නිවේදනයේ අගට යොද ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කරගත යුතුය. අයදුම්පත්‍රයේ ඒ ඒ ශීර්ෂයන් ලබා දී ඇති උපදෙස් අනුගමනය කරමින් පැහැදිලිව තම අත් අකුරෙන්ම සම්පූර්ණ කළ යුතුය. අංක 01 සිට 07 දක්වා කොටස් පළමු පිටුවටද ඉතිරිය දෙවන පිටුවටද ඇතුළත් වන සේ අයදුම්පත්‍රය සැකසිය යුතුය.

5.2 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2017.02.20 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ **"ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 14/4, පිළිපොතගම පාර, පිංඅරාව, බදුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්පත් බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ඌව පළාත් සභාවේ සිංහල මාධ්‍ය පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා රැකියා විරහිත උපාධිධාරීන් හා උසස් ජාතික ගණකාධිකරණ / වාණිජ ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම - 2017"** යනුවෙන් සහ ඔබ අයදුම් කරන විෂය හා විෂය අංකය පැහැදිලිව සටහන් කළ යුතුය.

5.3 අයදුම්කරුවෙකුට එක් විෂයක් සඳහා පමණක් ඉල්ලුම් කළ හැකි අතර, අයදුම්කරනු ලබන විෂය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. ඒ පිළිබඳව ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව සලකා බලනු නොලැබේ. උපලේඛන අංක 01 අනුව අයදුම්කරනු ලබන විෂය හා විෂය කේත අංකය, අයදුම්පතේ අදාළ ස්ථානයේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

5.4 එක් අපේක්ෂකයෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි. අයදුම්පතෙහි තම මනාපයේ අනුපිළිවෙළ අනුව උපලේඛන අංක 02 හි සඳහන් පුරප්පාඩු පාසල් අතරින් ඉල්ලුම් කරන විෂයට අදාලව පුරප්පාඩු පවතින පාසල් 03 ක් හා පාසලට අදාළ අනුක්‍රමික අංකය අයදුම්පතේ අදාළ ස්ථානයේ පැහැදිලිව සඳහන් කළ යුතුය. ඉල්ලුම් කරන පාසල් හා එහි අනුපිළිවෙළ පසුව වෙනස් කරනු නොලැබේ. සේවා අවශ්‍යතාවය මත ඉල්ලුම් කරන ලද පාසලකට හැර වෙනත් පාසැලකට පත්කළ හැකි අතර, පාසල් නම් කිරීම ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදුකරනු ලැබේ.

5.5 නියමිත ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන, විභාග හා පරිපාලන ගාස්තු ගෙවා නොමැති අයදුම්පත්, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් සහ නියමිත සුදුසුකම් නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍රය පුවත්පත් නිවේදනයේ දැක්වෙන ආකෘති පත්‍රයට අනුකූලවම ඉදිරිපත් කිරීම අපේක්ෂකයන්ගේ වගකීමකි. අයදුම්පත්‍ර තැපෑලේදී නැතිවීම හා ප්‍රමාද වීම පිළිබඳ කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. ඉදිරිපත් කරන අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

5.6 **අත්සන සහතික කිරීම :**
අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු / කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයෙකු / සාමදාන විනිශ්චයකාරවරයෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු / පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු / රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන රු. 240,360/- ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

06. විභාග හා පරිපාලන ගාස්තු :

විභාග ගාස්තු හා පරිපාලන වියදම් රු. 600/- කි. මෙම මුදල ***ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදයම් ශීර්ෂ 20.03.02.13 ට බැර වන පරිදි ඌව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට පමණක්*** මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පත්‍රයට අලවා එවිය යුතුය. ලදුපතේ මුල්පිටපත අයදුම්පත්‍රයේ අදාළ ස්ථානයේ නොගැලවෙන සේ අලවා එවීම අනිවාර්ය වන අතර, ඉදිරි ප්‍රයෝජනය සඳහා එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම වැදගත් වේ. ඌව පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබාගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් හෝ මුද්දර හෝ භාරගනු නොලබන අතර, එම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. කුමන හේතුවක් නිසා හෝ මෙම විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

07. විභාග පටිපාටිය සහ තරග විභාගයේ විෂය නිර්දේශය :

7.1 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට මෙම නිවේදනයේ සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් හට සහතික පරීක්ෂා කිරීමකින් තොරව තරග විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව මෙම කොමිෂන් සභාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. තමා ළඟ තබා ගත් අයදුම්පත්‍රයේ ඡායා පිටපත, විභාග ගාස්තු ගෙවූ ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සියේ පිටපත ද ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

7.2 තරග විභාගය බදුල්ල සහ මොනරාගල නගරවලදී පැවැත්වෙනු ඇත. ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වුවහොත් බදුල්ල නගරයේදී පමණක් විභාගය පැවැත්වෙනු ඇත.

7.3 නියමිත විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

7.4 විභාග දිනයේදී අපේක්ෂකයාගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ වලංගු ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම ලියවිලි හැර වෙනත් කිසිදු ලියවිල්ලක් පිළිගනු නොලැබේ.

7.5 තරග විභාගයට සිටීමට ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම අයදුම්කරු අදාළ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් එම අයදුම්කරු පත්වීම් ලබා දීම සඳහා නුසුදුස්සෙකු ලෙස සලකනු ලැබේ.

7.6. මෙම තරග විභාගය සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අපේක්ෂකයෙකු මුළු විභාගය සඳහාම පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයෙකිනි. අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු භාෂා මාධ්‍ය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

7.7. ලිඛිත තරග විභාගය බහුවරණ හා කෙටි පිළිතුරුවලින් සමන්විත පහත ප්‍රශ්න පත්‍ර 02 කින් යුක්ත වේ. සෑම අපේක්ෂකයෙකුම ප්‍රශ්න පත්‍ර දෙක (02) සඳහාම පෙනී සිටිය යුතුය.

- **අභියෝග්‍යතාව - කාලය පැය 01 - ලකුණු 100**
  අපේක්ෂකයා සතු ගුරු වෘත්තිය සඳහා වන කුසලතා, තර්කානුකූල බුද්ධිය පිළිබඳ දැනුම මැන බැලීම අරමුණු කොටගෙන මෙම ප්‍රශ්නපත්‍රය සකසනු ලැබේ. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විතය. එම ප්‍රශ්න සියල්ලටම කෙටි පිළිතුරු සැපයිය යුතුය.

- **සාමාන්‍ය දැනීම - කාලය පැය 01 - ලකුණු 100**
  ගුරු ක්ෂේත්‍රයට අදාලව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනුම හා / හෝ දේශීය වශයෙන් සිදුවී ඇති සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන නවීකරණය පිළිබඳව සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

තරග විභාගය සමත් වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා අවම වශයෙන් ලකුණු 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ලබාගත යුතුය.

7.8 ප්‍රායෝගික පරීක්ෂණය : **කාලය - විනාඩි 5 කට නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ. - උපරිම ලකුණු 25**
අයදුම්කරු විසින් හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය. මේ සඳහා පහත පරිදි ලකුණු හිමි වේ. මෙම පරීක්ෂණය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ.

අනු අංකය	ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක	නිර්ණායකයන්හි අරමුණ	උපරිම ලකුණු ප්‍රමාණය	සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය
01.	අරමුණ හා ප්‍රවිශ්ඨ වීම	සාර්ථකව පාඩමෙහි අරමුණ පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිශ්ඨ වීමේ හැකියාව ඇගයීම	05	02
02.	පෞරුෂය හා හඬ පාලනය	ගුරුවරයෙකු ලෙස මනා පෞරුෂයකින් යුතුවීම හා ඉගැන්වීමේදී මනා ලෙස හඬ පාලනය කිරීමේ ඇති හැකියාව ඇගයීම	05	02
03.	සන්නිවේදනයේ පැහැදිලි බව	ඉගෙනුම් / ඉගැන්වීම් ක්‍රියාවලියේදී අදාල කරුණු ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම	05	02
04.	කාල කළමනාකරණය	ලබා දෙනු ලබන කාලසීමාව තුළ අරමුණ කෙරෙහි ළඟා වීමේ කුසලතාව ඇගයීම	05	02
05.	ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම භාවිතය	අරමුණ කෙරෙහි ළඟා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිතා කිරීමේ හැකියාව ඇගයීම	05	02
	මුළු ලකුණු ප්‍රමාණය		25	10

* ප්‍රායෝගික පරීක්ෂණය සමත්වීම සඳහා එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු 2 බැගින් ලබා ගත යුතුය.

08. සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේදී සහභාගී නොවන අයදුම්කරුවන් පිළිබඳව කිසිදු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ.

09. එමෙන්ම සම්මුඛ පරීක්ෂණ දිනයට සියලු සහතික ඉදිරිපත් කළ යුතු අතර, පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක් භාර ගනු නොලැබේ.

10. සාවද්‍ය ගොරතුරු සැපයීම :

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුවද අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ යම් තොරතුරක් සාවද්‍ය බව හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් ඔහු / ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

11. මෙම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීම / නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාවෙන් කොටසක් සම්පූර්ණ කිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව හෝ මේ සම්බන්ධයෙන් වන කුමන හෝ කරුණක් පිළිබඳව අවසාන තීරණය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධි විධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම් / තීරණය කිරීම ඌව පළාත් ආණ්ඩුකාරවරයාගේ උපදෙස් මත ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සිදුකරනු ඇත.

(ආර්.එම්.ටී.බී. හාතියල්දෙණිය)
ලේකම්
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2017.01.25 වන දින,
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, බදුල්ල.

ආදර්ශ අයදුම්පත්‍රය

කාර්යාලීය ප්‍රයෝජනය පිණිසයි

ඌව පළාත් සභාවේ සිංහල මාධ්‍ය පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා රැකියා විරහිත උපාධිධාරීන්, උසස් ජාතික ගණකාධිකරණ / වාණිජ ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම - 2017

01. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :

(ඔබ අයත්වන දිස්ත්‍රික්කය "බදුල්ල" ද "මොනරාගල" ද යන්න පැහැදිලිව සඳහන් කරන්න)

02. 2.1 විභාගයට පෙනී සිටින නගරය (බදුල්ල - 1, මොනරාගල - 2)

නගරය	නගර අංකය

2.2 විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : සිංහල - 2, ඉංග්‍රීසි - 3

2.3 ඉල්ලුම් කරනු ලබන විෂය :

විෂය	විෂය කේත අංකය

(උපලේඛන අංක 01 අනුව ඔබ අයදුම්කරන විෂය හා විෂය කේත අංකය සඳහන් කරන්න)

2.4 ඉල්ලුම් කරන පාසල :

අනු අංකය	කලාපය	පුරප්පාඩු පාසල

(උපලේඛන 02 හි සඳහන් අයුරින් ඔබ අයදුම්කරන විෂයට අදාළව පුරප්පාඩු පවතින පාසල් 03 හා පාසලට අදාළ අනුක්‍රමික අංකය, කලාපය හා පාසලේ නම මනාපයේ අනුපිළිවෙලින් සඳහන් කළ යුතුය. මෙම අනුපිළිවෙළ කිසිදු අයුරකින් වෙනස් කරනු නොලැබේ)

03. 3.1 සම්පූර්ණ නම :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.2 අගට යෙදෙන නම මුලින්ද, අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම : Mr/Mrs/Miss
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා :HERATH A.M.N.

3.3 සම්පූර්ණ නම :
(සිංහලෙන් / දෙමළෙන්)

04. 4.1 ස්ථිර ලිපිනය :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

4.2 ස්ථිර ලිපිනය :
(සිංහලෙන් / දෙමළෙන්) :

4.3 දුරකථන අංකය :

05. ජාතික හැඳුනුම්පත් අංකය :

06. 6.1 උපන් දිනය : අවුරුද්ද මාසය දිනය

6.2 2017.02.20 දිනට වයස : අවුරුදු මාස දින

6.3 ස්ත්‍රී / පුරුෂ භාවය : ස්ත්‍රී - 1 / පුරුෂ - 0

6.4 විවාහක / අවිවාහක භාවය : විවාහක - 1 / අවිවාහක - 2

07. 2017.02.20 දිනට ඌව පළාතේ ස්ථිර පදිංචි කාලසීමාව : අවුරුදු මාස දින

08. අධ්‍යාපන සුදුසුකම් :

8.1 අ.පො.ස. (සා/පෙළ) විභාගය :

වර්ෂය : ..... විභාග අංකය :				
	විෂය	සාමාර්ථය	විෂය	සාමාර්ථය
01			05	
02			06	
03			07	
04			08	

8.2 අ.පො.ස. (උ/පෙළ) විභාගය :

වර්ෂය : ..... විභාග අංකය :	
විෂය	සාමාර්ථය
01	
02	
03	
04	

8.3 ලබාගෙන ඇති උපාධිය / ඩිප්ලෝමාව පිළිබඳ විස්තර :

උපාධිය / ඩිප්ලෝමාව	ලබාගත් ආයතනය	වලංගු දිනය	හදාරා ඇති විෂයන්	උපාධිය / ඩිප්ලෝමාව ලබා ඇති මාධ්‍ය

09. ගෙවා ඇති විභාග ගාස්තුව : රු. .....

විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය :.....

ලදුපත ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : .....

මුදල් ගෙවූ ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න

10. **අයදුම්කරුගේ සහතිකය :**

..... වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් මා විසින් ඉල්ලුම්කර ඇති ඉහත තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමටද හැකි බව දනිමි. තවද, තරග විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් / ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

දිනය : .....

.....
අයදුම්කරුගේ අත්සන

11. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..... ලිපිනයේ පදිංචි ..... මයා / මිය / මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු / ඇය ..... දින මා ඉදිරිපිටදී ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

දිනය : .....

.....
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන
(නිල මුද්‍රාව තබන්න)

සහතික කරන අයගේ සම්පූර්ණ නම : .....

තනතුර : .....

ලිපිනය : .....

උපලේඛන අංක 02 - පුරප්පාඩු පාසල් ලේඛනය

අංක	කලාපය	පාසලේ නම	01 - 11 වසර: ප්‍රාථමික	සිංහල	ව්‍යාපාර හා ගිණුම්කරණය	විශ්ව	තැටුම්	සංගීතය (පෙරදිග)	කෘෂි හා ආහාර තාක්ෂණ	ගණිතය	ගුගෝල විද්‍යාව	ඉතිහාසය	තොරතුරු තාක්ෂණය	රසායන විද්‍යාව	ශෞතික විද්‍යාව	ජීව විද්‍යාව	ව්‍යාපාර අධ්‍යනය	ආර්ථික විද්‍යාව	නාට්‍ය හා රංගකලාව	සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යනය	එකතුව
01.	බණ්ඩාරවෙල	බ/ කොටබක්ම විදුහල	1																		1
02.		බ/හෙලපුපුල විදුහල	1																		1
03.	වියළුව	බ/සොරණාතොට ම.ම.වි.				1							1								2
04.		බ/බුදුගේකන්ද මහ විදුහල				1															1
05.		බ/වත්තෙකැලේ මහ විදුහල	1																		1
06.		බ/වැල්කැලේ ප්‍රා.වි.	1																		1
07.		බ/හුඹහමඩ ම.වි.	1					1													2
08.		බ/පිටමාරුව ම.වි.	1	1					1												3
09.		බ/කළුගහකදුර මහ විදුහල				1															1
10.		බ/මොරහෙල මහ විදුහල	1																		1
11.		බ/කරදගහමඩ ම.වි.				1															1
12.		බ/පොල්ගහඅරාව මහ විදුහල	1	1																	2
13.		බ/වියළුව ඇල්ලන්ද ප්‍රා.වි.	1																		1
14.		බ/ඉටිකැන්පල ප්‍රා.වි.	1																		1
15.		බ/කෝමාරික ප්‍රා.වි.	1																		1
16.		බ/බෝගහපතන ප්‍රා.වි.	1																		1
17.		බ/මහකදුර ම.වි.											1								1
18.		බ/සූරියගොල්ල ම.වි.	1	1																	2
19.		බ/මිගොල්ල ම.වි.	1																		1
20.		බ/ගලදඩ ම.ම.වි.				1															1
21.		බ/ගෝඩුන්න ම.වි.											1								1
22.		බ/බෙරාමඩ ම.වි.	1																		1
23.		බ/වාසනාගම විදුහල	1																		1
24.		බ/එගොඩවෙල මහ විදුහල	1																		1
25.		බ/කොස්ගොල්ල විදුහල	1																		1
26.		බ/කොහාන විදුහල	1																		1
27.		බ/බටුයාය විදුහල	1																		1
28.		බ/ලබුගස්කලාව විදුහල	1																		1
29.		බ/මහකැලේ ම.වි.	1																		1
30.		බ/නාගොල්ල විදුහල	1																		1
31.		බ/වෙල්ලේවෙලකැන්න විදුහල	1																		1
32.		බ/කන්දකැපුදුල්පත ප්‍රා.වි.	1																		1
33.		බ/කලුගහකදුර මහ විදුහල				1															1
34.		බ/ඩී.එස්. සේනානායක ප්‍රා.වි.	1																		1
35.	තණමල්විල	මො/කීර්තිකුමාරපුර ක.වි.	1																		1
36.		මො/අගුණකොලපැලැස්ස ම.වි.					1														1
37.		මො/සෝමාදේවි ම.වි.	1		1		1	1										1			5
38.		මො/හම්බෙගමුව ම.වි.						1													1
39.		මො/සදරාජ ම.වි.	1				1	1													3
40.		මො/බෝදගම ම.වි.					1	1													2
41.		මො/සෙල්ලකතරගම ම.වි.	1					1													2
42.		මො/හබරළුවැව ම.වි.					1														1
43.		මො/අලුත්වැව ක.වි.	1					1													2
44.		මො/නිකවැව ක.වි.	1																		1
45.		මො/මහගම මහානාග ම.වි.	1				1	1													3
46.		මො/හම්බෙගමුව ජනපද ක.වි.	1																		1
47.		මො/සමගිපුර තරුණ ජනපද ක.වි.	1					1					1								3
48.		මො/කොටවෙහෙරමංකඩ ම.වි.	1				1	1													3
49.		මො/සෙවනගල ම.වි.					1	1													2
50.		මො/ගෝතම්ගම ක.වි.	1							1											2
51.		මො/නාලන්ද ක.වි.	1																		1
52.		මො/නුගේගලයාය ගුණරතන ප්‍රා.වි.	1																		1
53.		මො/විජයපුර ක.වි.	1				1	1													3
54.		මො/කිවුල්ආර ප්‍රා.වි.	1																		1
55.		මො/හම්බෙගමුව ප්‍රා.වි.	2																		2
56.		ආ.ප්‍රා.වි.	1																		1
57.		මො/ස්වර්ණ පුදිප ප්‍රා.වි.	1																		1
58.		මො/මහගම ආදර්ශ ප්‍රා.වි.	1																		1
59.		මො/මුතුමිණිගම ක.වි.					1														1
60.		මො/ඉදිකොළපැලැස්ස ප්‍රා.වි.	1					1													2
61.		මො/කෝවුල්ආරගම ප්‍රා.වි.	2																		2
62.		මො/රතඹලාගම ක.වි.						1													1
63.		මො/නියඳගල ප්‍රා.වි.	1																		1
64.		මො/කෙත්සිරිගම ක.වි.					1														1
65.	වැල්ලවාය	මො/වෙහෙරයාය ම.වි.		1																	1
66.		මො/ඔක්කම්පිටිය විජයබාහු ම.වි.				1															1
67.		මො/සිද්ධාර්ථ ම.වි.	1							1											2
68.		මො/අලුත්වෙල ක.වි.							1												1
69.		මො/ඇතිලිවැව ම.වි.											1						1		2
70.		මො/ඔක්කම්පිටිය ජනපද ක.වි.								1											1
71.		මො/පියනන්ද ක.වි.							1												1
72.		මො/වගුරුවෙල ම.වි.	1																		1
73.		මො/ජේ.එම්. කුමරදස ම.වි.							1					1							2
74.		මො/සියඹලාගුණය ක.වි.	1																		1
75.		මො/හඳපානාගල ම.වි.	1			1															2

අංක	කලාපය	පාසලේ නම	01 - 11 වසර: ප්‍රාථමික	සිංහල	ව්‍යාපාර හා ගිණුම්කරණය	විශ්ව	තැටුම්	සංගීතය (පෙරදිග)	කෘෂි හා ආහාර තාක්ෂණ	ගණිතය	ගුගෝල විද්‍යාව	ඉතිහාසය	තොරතුරු තාක්ෂණය	රසායන විද්‍යාව	ශෞතික විද්‍යාව	ජීව විද්‍යාව	ව්‍යාපාර අධ්‍යනය	ආර්ථික විද්‍යාව	නාට්‍ය හා රංගකලාව	සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යනය	එකතුව
76.	වැල්ලවාය	මො/ගෝනගංආර ක.වි.	1				1														2
77.		මො/ජනාසංඛ ආදර්ශ ක.වි.									1										1
78.		මො/උනාවටුන ක.වි.	1								1										2
79.		මො/ගම්පංගුව ක.වි.						1													1
80.		මො/මුණසිංහ ප්‍රා.වි.	1																		1
81.		මො/නියදැල්ල ක.වි.	1						1												2
82.		මො/මහසෙන්ගම ප්‍රා.වි.	1																		1
83.		මො/විහාරමහාදේවි ක.වි.						1	1												2
84.		මො/කුඩාඔය ම.වි.	1					1					1								3
85.		මො/කුඩාඔය ප්‍රා.වි.	1																		1
86.		මො/බලහරුව ක.වි.				1													1		2
87.		මො/කෙළුල්ල ක.වි.	1			1				1											3
88.		මො/කෙළුල්ල ජනපද ක.වි.						1	1												2
89.		මො/කිතුල්කොටේ ම.වි.	1			1			1				1								4
90.		මො/යෞවනකුමාරපුර ක.වි.	1																		1
91.		මො/මහආරගම ක.වි.	1			1			1												3
92.		මො/දෙබරආර ක.වි.	1			1															2
93.		මො/යාලබෝව ආදර්ශ ප්‍රා.වි.	1																		1
94.		මො/ආනපල්ලම ක.වි.								1											1
95.		මො/ශ්‍රී සුමන පෝතී ක.වි.								1											1
96.		මො/ශ්‍රී සුබෝධ ක.වි.							1												1
97.		මො/ඩී.එස්. සේනානායක ක.වි.	1			1			1												3
98.		මො/මොරහෙළගම ප්‍රා.වි.	1																		1
99.		මො/මල්වත්තාවෙල ප්‍රා.වි.	1																		1
100.		මො/හෙලගම විදුහල				1							1								2
101.		මො/ඔක්කම්පිටිය විජයබාහු ප්‍රා.වි.	1																		1
102.		මො/රංජන් විජේරත්න ම.වි.											1						1		2
103.		මො/බුදුරුවගල ප්‍රා.වි.	1																		1
104.	පස්සර	බ/මැදවෙලගම ම.වි.	1										1						1		3
105.		බ/මැටිගහකැන්න ම.වි.		1								1									2
106.		බ/අරවාකුඹුර විදුහල	1						1												2
107.		බ/අලකොලගල විදුහල	1																		1
108.		බ/ඇකිරිය වි.		1								1									2
109.		බ/ඉලිපතුකැන්න වි.	1			1				1											3
110.		බ/උඩකිරුව වි.								1		1									2
111.		බ/කොහොනාවෙල වි.	2																		2
112.		බ/ගල්වෙලගම වි.	3																		3
113.		බ/ගැරඩිඇල්ල වි.	1				1														2
114.		බ/ජයන්ති වි.	1				1						1								3
115.		බ/තොලබෝවත්ත වි.	1						1												2
116.		බ/නමුණුකුල වි.	1						1												2
117.		බ/පල්ලෙකිරුව වි.	1	1		1															3
118.		බ/මඩුගස්කලාව වි.	1					1		1											3
119.		බ/මඩුවත්ත වි.	1																		1
120.		බ/මිරියබැද්ද වි.	1																		1
121.		බ/ශ්‍රී ධම්මානන්ද වි.								1											1
122.		බ/වැවබැද්ද වි.	1	1							1										3
123.		බ/වේරගොඩ වි.	2																		2
124.		බ/මහාදෝව සිංහල වි.	1									1									2
125.		බ/කිරවනාගොඩ වි.	2																		2
126.		බ/ගල්ලුල්ල සිංහල වි.	2							1											3
127.		බ/පිස්ස විදුහල	1																		1
128.		බ/වැරල්ලගොල්ල විදුහල	1																		1
129.	මහියංගණය	බ/මැදඹය ක.වි.	1						1												2
130.		බ/මැදයාය ක.වි.	1																		1
131.		බ/දඹගොල්ල ක.වි.	1					1													2
132.		බ/සේරුපිටිය ක.වි.									1										1
133.		බ/බණ්ඩාරනායක ම.වි.	1																		1
134.		බ/හද්දන්නාව ම.වි.	1						1												2
135.		බ/ගිරාදුරුකෝට්ටේ ම.වි.	1							1											2
136.		බ/අලුත්තරම ක.වි.	1																		1
137.		බ/දම්බරාව ම.වි.							1												1
138.		බ/දෙහිගොල්ල ම.වි.	1									1									2
139.		බ/සොරබොරවැව ම.වි.	1																		1
140.		බ/හෙබරව ම.වි.	1																		1
141.		බ/දඹාන ක.වි.	1																		1
142.		බ/කුකුළාපොල ක.වි.	1						1												2
143.		බ/වේවත්ත ම.වි.	1																		1
144.		බ/රෝහන ක.වි.	1																		1
145.		බ/රත්කිඳ ම.වි.	1																		1
146.		බ/අලුයටවෙල ම.වි.		1				1		1								1			4
147.		බ/දිවුලපැලැස්ස ම.වි.					1			1											2
148.		බ/මිල්ලත්තුව ම.වි.	1																		1
149.		බ/ගල්පෝරුයාය ක.වි.	1																		1

උපලේඛන අංක 02 - පුරප්පාඩු පාසල් ලේඛනය

අංක	කලාපය	පාසලේ නම	01 - 11 වසර												අ.පො.ස. (උ.පෙළ)					
			ප්‍රාථමික	සිංහල	ව්‍යාපාර හා ගිණුම්කරණය	වීත්‍ර	තැටුම	සංගීතය (පෙරදිග)	කෘෂි හා ආහාර තාක්ෂණ	ගණිතය	හුගෝල විද්‍යාව	ඉතිහාසය	තොරතුරු තාක්ෂණය	රසායන විද්‍යාව	භෞතික විද්‍යාව	ජීව විද්‍යාව	ව්‍යාපාර අධ්‍යයනය	ආර්ථික විද්‍යාව	නාට්‍ය හා රංගකලාව	සත්තිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය	එකතුව
150.	මහියංගණය	බ/වටවන ක.වි.	1					1													2
151.		බ/සේනානිගම ක.වි.	1																		1
152.		බ/මීගහහේන ක.වි.	1																		1
153.		බ/උල්හිටිය ම.වි.	1																		1
154.		බ/ගුරුකුඹුර ක.වි.	1																		1
155.		බ/අගලඹය ක.වි.	1																		1
156.		බ/බතලයාය ම.වි											1								1
157.		බ/රොටලවෙල ම.වි.	1				1														2
158.		බ/බෙලගන්වැව ක.වි.	1																		1
159.		බ/උල්හිටිය ක.වි.	1																		1
160.		බ/තෙල්දෙණියාය ක.වි.	1																		1
161.		බ/හොබරියාව ක.වි.	1																		1
162.		බ/ගින්නෝරුව ක.වි.	1																		1
163.		බ/කෝවිල්යාය ක.වි.	1																		1
164.		බ/හද්දත්තාව ප්‍රා.වි.	1																		1
165.		බ/සිද්ධාර්ථ ප්‍රා.වි.	1																		1
166.		බ/අලුයටවෙල ප්‍රා.වි.	1				1														2
167.		බ/ගිරාඳුරුකෝට්ටේ ප්‍රා.වි.	1																		1
168.		බ/ඇකිරියන්කුඹුර ම.වි.	1																		1
169.		බ/පෙතියාගොඩ ම.වි.									1										1
170.		බ/රිදීමාලියද්ද ම.වි.	1																		1
171.		බ/කුරුවිතැන්න ම.වි.							1												1
172.		බ/අරාව ම.වි.	1																		1
173.		බ/අලුකැටියාව ක.වි.	1																		1
174.		බ/උරණිය ක.වි.											1								1
175.		බ/කන්දේගම ක.වි.	1																		1
176.		බ/කුඩාලුනුක ක.වි.	1																		1
177.		බ/නාගදීප ක.වි.	1																		1
178.		බ/යල්වෙල ම.වි.	1						1												2
179.		බ/රිටිගහඅරාව ක.වි.		1																	1
180.		බ/දිරියගම ක.වි.	1																		1
181.		බ/දික්යාය ක.වි.	1																		1
182.		බ/පින්නගොල්ල ක.වි.		1																	1
183.		බ/ගුරුමඩ ක.වි.						1													1
184.		බ/ගැමුණුපුර ම.වි.	1																		1
185.		බ/තිස්සපුර ම.වි.														1					1
186.		බ/ඔරුබැඳිවැව ම.වි.								1											1
187.		බ/අරාවත්ත ක.වි.		1																	1
188.		බ/අහයපුර ක.වි.							1												1
189.		බ/කෙසෙල්පොත යාය 12 ක.වි.					1						1								2
190.		බ/කෙසෙල්පොත යාය 11 ක.වි.	1					1													2
191.		බ/ඉකිරියගොඩ ක.වි.	1							1											2
192.		බ/වෙලම්පැලේ ක.වි.	1																		1
193.		බ/නාගදීපයාය 01 විදුහල	1																		1
194.		බ/තලාවේගම ක.වි.	1																		1
195.		බ/දික්කැන්දයාය ක.වි.	1																		1
196.		බ/ධර්මපාල ක.වි.	1																		1
197.		බ/කලුකැලේ ක.වි.	1																		1
198.		බ/තිස්සපුර ප්‍රා.වි.	1																		1
199.		බ/ආඳාදැල්පත ප්‍රා.වි.	1																		1
200.		බ/පෙතියාගොඩ ප්‍රා.වි.	1																		1
201.	වැලිමඩ	බ/ශ්‍රී නැදුන්ගමුව ම.වි.	1																		1
202.		බ/ශ්‍රී රතනජෝති ම.වි	1																		1
203.		බ/ඇල්ල වැලිමඩ වි.	1																		1
204.		බ/පන්නලවෙල ම.වි.								1											1
205.		බ/විදුරුපොල වි.	1																		1
206.		බ/පිටපොල වි.				1															1
207.		බ/ලන්දේගම විදුහල	1																		1
208.		බ/එරබද්ද වි.	1																		1
209.		බ/බෝගහකුඹුර ප්‍රා.වි.	1																		1
210.		බ/මැදවෙල ප්‍රා.වි.	2																		2
211.		බ/වැවේගම වි.	1																		1
212.		බ/සපුගොල්ල ම.වි.							1												1
213.		බ/යහලඅරාව ම.වි.				1				1											2
214.		බ/බුස්දල්ල වි.								1											1
215.		බ/බෝගහමඩින්න වි.	1																		1
216.		බ/දිඹුලන වි.	1									1									2
217.		බ/දියබොකදුර වි.		1								1									2
218.		බ/ගලහගම වි.		1						1											2
219.		බ/රාජකීය වි.									1						1				2
220.		බ/පේරවැල්ල වි.	1				1						1								3
221.		බ/රහුපොල වි.	1																		1
222.		බ/උණපාන වි.		1																	1
223.		බ/උඩපේරුව වි.											1								1
224.		බ/ඌවපරණගම ම.වි.	1	1																	2
225.		බ//ජනාධිපති වි.							1												1
226.		බ/යාලගමුව වි.	1																		1
227.		බ/ඇල්ලන්ද වි.	2																		2
228.		බ/මහකුඹුර වි.	1																		1
229.		බ/මැදිපොකුණ වි.	2																		2
230.		බ/හාගිලිඇල්ල වි.	1							1											2
231.		බ/බෝකොටුතැන්න වි.	2																		2
232.		බ/ස්වර්ණහංස ප්‍රාථමික විදුහල	1																		1
233.		බ/උඩුහාවර මැදහින්න වි.	1																		1
234.		බ/ගම්පහ මස්පන්න මහ විදුහල								1									1		2
235.		බ/ගම්පහ මස්පන්න ප්‍රාථමික විදුහල	1																		1
236.		බ/පත්වැව විදුහල	1																		1
237.		බ/බොරගස් ප්‍රාඥසේන විදුහල	1																		1
238.		බ/හෙවනකුඹුර පුත්‍යසාර විදුහල	1																		1
239.		බ/මාලිගාතැන්න විදුහල	1																		1
240.	මොනරාගල	මො/හුලංදව වම ම.වි.	1										1								2
241.	මොනරාගල	මො/කොළොන්වින්න ක.වි.							1							1					2
242.		මො/දෙබැද්දේකිවුල ක.වි.	2																		2
243.		මො/විද්‍යාලෝක ම.වි.		1						1											2
244.		මො/වැලියාය මයුරගිරි ක.වි.				1															1
245.		මො/තෙනගල්ලන්ද ම.වි.	2							1											3
246.		මො/කලවැල්ආරගම ක.වි.	2																		2
247.		මො/කහම්බාන ප්‍රා.වි.	1																		1
248.		මො/පඤ්ඤානන්ද ම.වි.	2							1											3
249.		මො/කොටිගල්හෙල ක.වි.	1																		1
250.		මො/කිවුලෙආර ප්‍රා.වි.	1																		1
251.		මො/හිදිකිවුල ක.වි.									1										1
252.		මො/හොරොම්බුව ක.වි.	1							1											2
253.		මො/සුදුවතුරආර ක.වි.	1																		1
254.		මො/ඇතිමලේ ම.වි.				1				1											2
255.		මො/දෙඹගහවෙල ම.ම.වි.										1									1
256.		මො/සියඹලාණ්ඩුව ම.වි.			1			1													2
257.		මො/ඇතිමලේ 1 පියවර ක.වි.	2										1								3
258.		මො/උඩික්කැපුආර ප්‍රා.වි.	1																		1
259.		මො/කොටියාගල ක.වි.	2	1																	3
260.		මො/ගලබැද්ද ම.වි.	1										1								2
261.		මො/විලඹය ශ්‍රීපාලි ම.වි.	2			1			1									1			5
262.		මො/කන්දඋඩපංගුව ම.වි.	1																		1
263.		මො/කෝන්ගස්පිටිය ක.වි.	1								1										2
264.		මො/ගලේපරාව ක.වි.								1											1
265.		මො/දනකිරිය ක.වි.	1							1											2
266.		මො/පල්ලෙවෙල ම.වි.				1						1									2
267.		මො/බුද්දම ම.වි.				1															1
268.		මො/මහකළුගොල්ල ක.වි.	2				1			1											4
269.		මො/බඹරගස්රොද ක.වි.	1																		1
270.		මො/බරවාය ක.වි.	2																		2
271.		මො/රිටිගහවත්ත ක.වි.				1															1
272.		මො/තිස්සපුර ක.වි.	1							1											2
273.		මො/මියාගල ක.වි.	1																		1
274.		මො/මුතුකණ්ඩිය 1 පියවර ක.වි.								1											1
275.		මො/මුතුකණ්ඩිය 3 පියවර ක.වි.	1							1											2
276.		මො/කරානගම ක.වි.	1						1												2
277.		මො/ගැමුණුපර ක.වි.	1			1															2
278.		මො/කළුඹබ්බ ක.වි.		1						1											2
279.		මො/පහතඅරාව ක.වි.	1																		1
280.		මො/වත්තේගම සිරිමල් ක.වි.						1													1
281.		මො/4 කණුව ම.වි.	1					1				1									3
282.		මො/වරාගම ක.වි.	1																		1
283.		මො/ඇතිමලේ ප්‍රා.වි.	1																		1
284.		මො/මැදිරිය රාජ්‍යානන්ද ම.ම.වි.		1											1						2
285.		මො/හිඟුරුකඩුව ම.වි.										1						1			2
286.		මො/ඇත්තලමුල්ල ක.වි.								1											1
287.		මො/ඇත්පට්ටිය ප්‍රා.වි.	1																		1
288.		මො/ශ්‍රී පේමානන්ද ම.වි.	1					1					1								3
289.		මො/කිරවනාගොඩ ක.වි.								1			1								2
290.		මො/ගැඩවිල ක.වි.				1			1												2
291.		මො/බෝගහපැලැස්ස ක.වි.	1																		1
292.		මො/මඩුගස්මුල්ල ක.වි.								1											1
293.		මො/මුතුකෙළියාව ම.වි.										1									1
294.		මො/වරාදෙල ක.වි.	1						1												2
295.		මො/දේවතුර ප්‍රා.වි.	1																		1
296.		මො/මාළිගැතැන්න ම.වි.	1		1	1															3
297.		මො/තැන්නයාය ප්‍රා.වි.	1																		1
298.		මො/කළුගහවාඩිය ප්‍රා.වි.	1																		1
299.		මො/නිශ්ශංක ප්‍රා.වි.	1																		1
300.		මො/කෝවුල්ආරගම ක.වි.					1	1													2
301.	බිබිල	මො/හේපොල ක.වි.	1																	1	2
302.		මො/යශෝධරා බාලිකා වි.									1										1
303.		මො/මල්ලැහැව ම.වි.									1										1
304.		මො/රතනදෙණිය ක.වි.								1											1
305.		මො/තඹාන ක.වි.	2																		2
306.		මො/කරමැටිය ක.වි.		1									1								2
307.		මො/බුළුපිටිය ම.වි.	1						1			1									3
308.		මො/මුදියල ක.වි.				1															1
309.		මො/ඇතුන්දමුවාව ක.වි.	1																		1
310.		මො/දහගෝනිය ප්‍රා.වි.	1					1		1											3
311.		මො/ඌරාවුල ක.වි.	1							1											2
312.		මො/මැදගම ප්‍රා.වි.	1																		1
313.		මො/ඌව විජය ප්‍රා.වි.										1									1
314.		මො/සේනාපතිය ම.වි.	1	1																	2
315.		මො/කැන්දවින්න ම.වි.	1														1				2
316.		මො/මඩුල්ල ම.වි.											1								1
317.		මො/ගල්පොක්ක ක.වි.		1		1															2
318.		මො/මොනරවාන ක.වි.		1																	1
319.		මො/කිණගොඩ ක.වි.	2																		2
320.		මො/ඉළුක්කුඹුර ප්‍රා.වි.	1																		1
321.		මො/ගල්ගමුම ම.වි.	1				1														2
322.		මො/ඩී.එස්. සේනානායක ම.වි.						1													1
323		මො/නාගහමඩ ම.වි.	1																		1
324.		මො/පොල්ගහපිටිය ප්‍රා.වි.	1																		1
325.		මො/තම්පලාවෙල ක.වි.					1														1
326.		මො/රත්මල්ගහඇල්ල ක.වි.	1										1								2
327.		මො/අලුගල්ගේ ප්‍රා.වි.	1	1																	2
328.		මො/රතුගල ප්‍රා.වි.	2																		2
329.		මො/ගල්ගමුව නව. ප්‍රා.වි.	1																		1
		එකතුව	255	25	3	30	23	32	28	40	10	14	25	1	1	1	2	4	5	1	500